# සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

## වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

MEPA

# புரப்பாடு

2008 අංක 35 දරන පනත යටතේ ස්ථාපිත කරන ලද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පහත තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රැකියා විස්තරය**

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ අධිකාරියට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම.

**තනතුර - සහකාර කළමනාකරු (නීති) - (MM 1-1) තනතුරු (01) - කොළඹ**

**බාහිර අයදුම්කරුවන් සඳහා බඳවා ගැනීම**

**(අ) අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ උපාධියක් සහිත ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම

සහ

**(ආ) පළපුරුද්ද**

නීතිඥවරයෙකු ලෙස වසර 03 ක සේවා පළපුරුද්ද

**(ඇ) වෙනත් සුදුසුකම්**

තනතුරෙහි කාර්ය භාරය ඵලදායි අන්දමින් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් වන මට්ටමේ

1. ඉංග්‍රීසි භාවිතය පිළිබඳ විශිෂ්ට නිපුණතාවය
2. පරිගණක භාවිතය පිළිබඳ නිපුණතාවය

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය** : MM 1-1-2016 - රු. 53,175 - 1,375 x 10 - 1,910 x 15 - රු. 95,575/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 ට අනුව)

**පොදු**

**(අ) සෑම අයදුම්කරුවෙකුම,**

01. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
02. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
03. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**(ආ) සුදුසුකම් ලබන දිනය**

සේවයට / තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණි.

**(ඇ) පත්වීමේ ස්වභාවය**

තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදල (EPF) වෙනුවෙන් සේවකයා විසින් ගෙවනු ලබන 10% ට අමතරව අධිකාරියේ 15% ක දායකත්වයක් සහ සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක අමතර දායකත්වයක්.

**අයදුම්පත්‍ර එවීම**

අධිකාරියේ පත්වීම් බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් යොමු කළ යුතුය. අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ජීව දත්ත සහ අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ උප්පැන්න සහතිකය, ග්‍රාම නිලධාරී සහතිකය, පොලිස් වාර්තාව, සියලුම අධ්‍යාපන සහතික, වෙනත් සුදුසුකම් සනාථ කරන සහතිකවල ඡායා පිටපත් අමුණා විස්තර සහිතව සම්පූර්ණ කළ අයදුම්පත් 2021.10.01 වෙනිදාට හෝ ඊට පෙර ලැබෙන පරිදි සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 වෙත ලියාපදිංචි තැපැලෙන් හා hrdmepa@gmail.com යන විද්‍යුත් තැපැලෙන් එවිය යුතුය. ආදර්ශ අයදුම්පත www.mepa.gov.lk වෙබ් අඩවිය මගින් බා ගත හැක. අයදුම්පත්‍රය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ සහ විද්‍යුත් පණිවුඩයේ ඉල්ලුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණය සඳහා ජාතික හැඳුනුම්පත සහ ඉහත ඡායා පිටපත් මගින් ඉදිරිපත් කරන ලද සහතිකයන්හි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

තැපැලෙන් අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳ අප අධිකාරිය වගකියනු නොලැබේ.

**සභාපති,**
**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,**
**අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.**

Source: Dinamina, Daily News, www.mepa.gov.lk (2021.09.17)